# ක්‍රියාකාරකම් පත්‍රිකාව

## ගනුදෙනුවල ද්විත්ව බලපෑම

- පහත දී ඇති වරණ අතුරින් වඩාත් නිවැරදි වරණය තෝරන්න.

1. පහත X තීරුවෙන් ගනුදෙනු ද Y තීරුවෙන් එයට අදාළ ද්විත්ව බලපෑම්ද දැක් වේ.

| X තීරුව | Y තීරුව |
|---|---|
| 1.අමල් රු 50000 ක ප්‍රාග්ධනයක් ව්‍යාපාරයට යෙදීම. | A-මුදල් වත්කම වැඩිවීම<br>බැංකු ණය වැඩිවීම |
| 2.බැංකුවෙන් රු 20000ක ණය මුදලක් ලබාගැනීම | B-මෝටර් රථ වත්කම වැඩිවීම<br>ප්‍රාග්ධනය වැඩිවීම |
| 3. අමල් තමා ගේ මෝටර් රථය ව්‍යාපාරයට ගෙන ඒම. | C- ප්‍රාග්ධනය අඩුවීම<br>මුදල් වත්කම අඩුවීම |
| 4.ව්‍යාපාරයේ මුදල් ගැනිලි ලෙස රු 5000ක් ගැනීම | D- මුදල් වත්කම වැඩිවීම<br>ප්‍රාග්ධනය වැඩිවීම |

- X තීරුව හා Y තීරුව ගැලපූ විට නිවැරදි පිළිතුරු ඇතුළත් කාණ්ඩය වන්නේ?
    1) 1-B,2-C,3-A, හා 4-D
    2) 1-D,2-A,3-B, හා 4-C
    3) 1-C,2-B,3-A, හා 4-D
    4) 1-D,2-A,3-C, හා 4-B

2. පහත වගුව සම්පූර්ණ කරන්න.

| ගනුදෙනුව | හරවිය යුතු ගිණුම | බැරවිය යුතු ගිණුම |
|---|---|---|
| 1.ව්‍යාපාරිකයා තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ව්‍යාපාරයෙන් මුදල් ලබා ගැනීම | ....................................... | ......................................... |
| 2.බැංකුවෙන් ලබාගත් ණය මුදලින් කොටසක් ආපසු ගෙවීම | ....................................... | .......................................... |
| 3.සුපුන්ට රු 2000ක බඩු තොගයක් ණයට විකිණීම | ....................................... | ............................................ |

(ගැනිලි ගිණුම හර,මුදල් ගිණුම බැර,බැංකු ණය ගිණුම හර, මුදල් ගිණුම බැර,ණයගැති ගිණුම(සුපුන්)හර ,විකුණුම් ගිණුම බැර)

3. මුදල් පොත ඉටු කරන ද්විත්ව කාර්යන් වන්නේ?
    i. ලැබීම් හා ගෙවීම් ගිණුමක් ලෙස ක්‍රියා කිරීමයි.
    ii. වවුචර හා ලදුපත් මගින් ගනුදෙනු සටහන් කිරීමයි.
    iii. මූලික පොතක් මෙන්ම ලෙජර් ගිණුමක් ලෙසද භාවිතා කිරීම.
    iv. මුදලින් මෙන්ම ණයට සිදුවන ගනුදෙනුද සටහන් කිරීම.

අන්තර්ගතය :- ආර්. එම්.ඒ සිල්වා-ගුරු උපදේශක-හම්බන්තොට
සැකසුම :- එච්.එම්. එච්. එස්.තිලකරත්න,මප/දෙනු/ශ්‍රී ස්වර්ණ ජෝති ජාතික පාසල,කිරිඔත්කුඹුර

The National e-learning Portal for The General Education

4. ලැබූ ගෙවල් කුලී ආදායම රු 5000 සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ?
   i. ලැබූ ගෙවල් කුලී ආදායම ගිණුම හර- මුදල් ගිණුම බැර
   ii. ලැබූ ගෙවල් කුලී ආදායම ගිණුම හර- ගෙවූ ගෙවල් කුලී ආදායම ගිණුම බැර
   iii. ගෙවූ ගෙවල් කුලී ආදායම ගිණුම හර- ලැබූ ගෙවල් කුලී ආදායම ගිණුම බැර
   iv. මුදල් ගිණුම හර- ලැබූ ගෙවල් කුලී ආදායම ගිණුම බැර

5. “අඩුවීම හර වැඩිවීම බැර” යන ගිණුම් කරණ මූලධර්මය අදාළ වන්නේ?
   i. හිමිකම් හා වගකීම් ගිණුම් වලටය.
   ii. වියදම් හා ආදායම් ගිණුම් වලටය.
   iii. වගකීම් හා වියදම් ගිණුම් වලටය.
   iv. වත්කම් හා හිමිකම් ගිණුම් වලටය.

- පහත සඳහන් ගනුදෙනු ඇසුරෙන් ප්‍රශ්න අංක 6,7,හා 8 යන ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.
   A. රු 50000 ක මුදලක් ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට යෙදවීම.
   B. ව්‍යාපාරයේ රක්ෂණ ගාස්තු ලෙස රු 5000ක් ගෙවීම.
   C. සපුමල්ගෙන් භාණ්ඩ ණයට ගැනුම් රු 3000
   D. යන්ත්‍රයක් මිලට ගත්තා රු 6000

6. මෙම ගනුදෙනු ඇසුරෙන් වත්කම් වලට පමණක් බලපාන ගනුදෙනුව වන්නේ?
   i. A ii. B iii. C iv. D
7. එක් වත්කමක් වැඩි වී හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුව වන්නේ?
   i. A ii. B iii. C iv. D
8. මුදල් පොතෙහි සටහන් නොවන ගනුදෙනුවක් වන්නේ?
   i. A ii. B iii. C iv. D
9. පහත සඳහන් ප්‍රකාශ සත්‍යයද අසත්‍යයද යන්න සඳහන් කරන්න.
   a) මුදල් පොත ද්විත්ව කාර්යක් ඉටුකරයි. (...........................)
   b) ව්‍යාපාරයක ගිණුම් සියල්ල ඇතුළත් පොත ජ'නලයයි (...........................)
   c) ප්‍රාග්ධන ගිණුම වගකීම් ගිණුමකි. (...........................)
   d) බැංකු ණය ලබාගැනීම නිසා බාහිර පාර්ශවයන්ට බැඳීමක් ඇති කෙරේ. (...........................)
10. වත්කමක් වැඩිවී වගකීමක් වැඩිවන ගනුදෙනුව වන්නේ?
   i. අකිල රු 50000 ක මුදලක් ව්‍යාපාරයට යෙදවීමයි.
   ii. තාරකගෙන් රු 20000 ක බඩු තොගයක් ණයට ලබා ගැනීමයි.
   iii. ලී බඩු උපකරණ රු 50000ක් ගෙවා ලබා ගැනීමයි.
   iv. රු 10000 ක බඩු තොගයක් අත්පිට මුදලට විකිණීමයි.

අන්තර්ගතය :- ආර්. එම්.ඒ සිල්වා-ගුරු උපදේශක-හම්බන්තොට
සැකසුම :- එච්.එම්. එච්. එස්.තිලකරත්න,මප/දෙනු/ශ්‍රී ස්වර්ණ ජෝති ජාතික පාසල,කිරිඹත්කුඹුර

The National e-Learning Portal for The General Education

The National e-learning Portal for The General Education

අන්තර්ගතය :- ආර්.  එම්.ඒ සිල්වා-ගුරු උපදේශක-හම්බන්තොට
සැකසුම :- එච්.එම්. එච්. එස්.තිලකරත්න,මප/දෙනු/ශ්‍රී ස්වර්ණ ජෝති ජාතික පාසල,කිරිඹත්කුඹුර